## අග්‍රහාර රන් රක්ෂණ යෝජනා ක්‍රමය

අර්ධ රාජ්‍ය ආයතනවල සේවයෙහි නියුත්තවූවන් සහ ඔවුන්ගෙන් යැපෙන පවුලේ සාමාජිකයන්ට හිමිවන ප්‍රතිලාභ පහත පරිදි වේ.

උපලේඛනය 01

| | සාමාජිකයන්ට සහ ඔවුන්ගෙන් යැපෙන පවුලේ සාමාජිකයන්ට(පවුල් ඒකකයට) හිමි ප්‍රතිලාභ | හිමිකම් වටිනාකම (උපරිමය) |
|---|---|---|
| 01 | පෞද්ගලික රෝහලක රෝහල් ගතවීමකදි<br>(එක් සිද්ධියක් සඳහා උපරිමය රු.200,000 )<br>* කාමර ගාස්තු සඳහා රු.8,000 (දිනකට) (උපරිමය දින 10)<br>* ඖෂධ, ශල්‍යාගාර වියදම් රු. 80,000<br>* වෛද්‍ය ගාස්තු සඳහා රු. 50,000<br>* වෛද්‍ය පරීක්ෂණ රු. 40,000 | රු.350,000<br>(වාර්ෂිකයට යටත්ව) |
| 02 | ඉහත වර්ගීකරණයන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් ( පෞද්ගලික ආයුර්වේද රෝහල දේශීය විෂය භාර අමාත්‍යංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතුය) | රු.200,000<br>(වාර්ෂිකයට යටත්ව) |
| 03 | රජයේ රෝහලක හෝ රජයේ ආයුර්වේද රෝහලක රෝහල් ගතවීමකදි දිනකට රු.3,000 බැගින් වසරකට උපරිම දින 14 ක් සඳහා<br>((එක් සිද්ධියක් සඳහා උපරිමය දින 07) | රු.42,000<br>(වාර්ෂිකයට යටත්ව) |
| 04 | දරු උපත්<br>**පෞද්ගලික රෝහල්ගතවීම්**<br>* සිසේරියන් සැත්කම සහිත දරු උපත්<br>* සාමාන්‍ය දරු උපත් සඳහා<br>**රජයේ රෝහලක රෝහල් ගත වීමකදි**<br>සිසේරියන් / සාමාන්‍ය දරු උපත් (දිනකට රු.3,000 බැගින් උපරිම දින 05) | රු.100,000<br>රු.50,000<br>රු.15,000 |
| 05 | පවුලේ සාමාජිකයන් සඳහා හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම | රු.200,000 |

**සාමාජිකයන් හා පවුලේ සාමාජිකයන්ට හිමිවන විශේෂිත ප්‍රතිලාභ පහත පරිදි වේ**

| | | සාමාජිකයන්ට | පවුලේ සාමාජිකයන් සදහා |
|---|---|---|---|
| 01 | **හදවත් සැත්කම් සදහා** | රු.1,000,000 | රු.200,000 |
| 02 | **පිළිකා රෝග සදහා** | රු.600,000 | |
| 03 | **වකුගඩු රෝග සදහා ( Kidney Tranplant )** | රු.1,200,000 | |
| 04 | **මොළයේ ශල්‍යකර්ම සදහා** | රු.1,200,000 | |
| 05 | **දණහිස් බද්ධ කිරීම සදහා** | රු.250,000 | |
| 06 | **උකුල් ඇට බද්ධ කිරීම සදහා** | රු.250,000 | |
| 07 | **ශ්‍රවන උපකරණ සදහා** | රු.100,000 | රු.50,000 |
| 08 | **අක්ෂි කාච බද්ධ කිරීම සදහා** | රු.50,000 | රු.20,000 |
| 09 | **පුද්ගල හදිසි අනතුරු හා ස්වභාවික මරණ හිමිකම් රක්ෂණාවරණය**<br>❖ **හදිසි අනතුරු මරණ**<br>❖ **ස්වභාවික මරණ** | රු.2,000,000<br>රු.700,000 | - |
| 10 | **හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයකදී** | රු.1,500,000 | - |
| 11 | **රෝගාබාධයක් හේතුවෙන් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවයකදී (ජීවිත කාලයකටම එක් වරක් පමණි)** | රු.200,000 | - |

**කොන්දේසි**

1) **විවාහක සාමාජිකයන්**

සාමාජිකයා කලත්‍රයා සහ රැකියා වි රහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21ට අඩුදරුවන්

**අවිවාහක සාමාජිකයන්**

සාමාජිකයා සහ වයස අවුරුදු 70 ට අඩු සාමාජික නිළධරයාගේ දෙමාපියන්

2) මෙම රක්ෂණාවරණය යටතේ සාමාජිකයාට පමණක් හිමිවන විශේෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මාස 03ක වාරික මුදල් ලැබියයුතු අතර ඉන්පසුව ඇතිවන සිද්ධීන් සඳහා ප්‍රතිලාභ හිමිවේ.

- හෘද සැත්කම්
- මොළයේ ශල්‍ය කර්ම
- වකුගඩු බද්ධකිරීම්
- පිළිකා ප්‍රතිකාර

3) දරු උපත් සඳහා මාස 06ක මුදල් ලැබියයුතු අතර ඉන්පසුව ඇතිවන සිද්ධීන් සඳහා ප්‍රතිලාභ හිමිවේ.

4) රෝහල් ගතවීම් හා වෙනත් සිද්ධීන් වෙනුවෙන් මාස 03 කට පසුව සිදුවන රෝහල් ගතවීම් හෝ ඇතිවන වෙනත් සිදුවීම් සඳහා ප්‍රතිලාභ හිමිවේ.

5) රක්ෂණාවරණය ලබා ගැනීමෙන් පසු අදාල සාමාජිකයන් අඛණ්ඩව රක්ෂණාවරණය පවත්වා ගෙනයා යුතු අතර ඉවත්විය නොහැක.

6) මෙම රක්ෂණයෝජනා ක්‍රමය සඳහා අදාල ආයතනය ඇතුලත් විමේදී මූලික අවස්ථාවේදී මෙහි සාමාජිකත්වය ලබා නොගන්නා නිලධාරීන් නැවත මෙම යෝජනා ක්‍රමය සඳහා ඇතුලත් වන්නේනම් අදාල රක්ෂණ වාරික තුනක් අයවීමෙන් පසුව ඇති සිද්ධි සඳහා ප්‍රතිලාභ හිමිකම් ගෙවනු ලබයි.